# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2335/12 – 2023 ජූනි මස 06 වැනි අඟහරුවාදා – 2023.06.06**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2016/129.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.11.25 දිනැති හා අංක 2203/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.10.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, කොට්ටාව, ලියනගොඩ පාර, අංක 1144/5/ඒ හි පදිංචි කේ.ඩබ්. රංජන් සිසිර මයා සහ කොළඹ 03, ගාලු පාර, ඊ.එච්. කුරේ ගොඩනැගිල්ල, අංක 411 හි පිහිටි සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.05.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මැයි මස 26 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය.**

කේ. ඩබ්. රංජන් සිසිර,
අංක 1144/5/ඒ, ලියනගොඩ පාර,
කොට්ටාව, පන්නිපිටිය.

*ඉල්ලුම්කරු*

නඩු අංකය: ඒ /10/ 2021

1R /Com/04/2016/129

එදිරිව

සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික)
සමාගම. අංක 411, ඊ. එච්. කුරේ
ගොඩනැගිල්ල, ගාලු පාර,
කොළඹ 03

*වග උත්තරකරු*

**තීන්දුව**

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා අංක 68 අංක 39 (1968 ංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පත් කොට ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ:

"සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ විශේෂ (M2) ශ්‍රේණියේ ගබඩා නිලධාරියකු ලෙස සේවය කළ කේ. ඩබ්. රංජන් සිසිර මහතාට විරුද්ධව විනය පරීක්ෂණයක් පවත්වා ඔහුව A5 ශ්‍රේණියේ ගබඩා සහකාර තනතුරට තත්ත්වයෙන් පහත හෙලීම හා අදළ විනය නියෝගයෙන් ඔහුට ලබාදුන් අනෙකුත් දඬුවම් යුක්ති සහගත ද? එසේ නැතිනම් එම සේවකයාට හිමිවිය යුතු වෙනත් සහනයක් ඇත්ද?

ශ්‍රී ලංකා විදුලි (පුද්ගලික) සමාගමෙහි සේවයේ නියුතු කේ.ඩබ්. රංජන් සිසිර මහතා විසින් 2015.12.08 වන දින ගරු කාර්මික අධිකරණය ඉදිරියේ ගොනුකරන ලද ඉල්ලුම් පත්‍රය ප්‍රකාරව විමර්ශනයක් ආරම්භකර ඇත.

මෙහිදී ඉල්ලුම්කරුගේ ඉල්ලුම් පත්‍රය ප්‍රකාරව පහත සඳහන් සහනයන් ගරු කාර්මික අධිකරණයෙන් අයැද ඇත. එනම්;

අ - විනය පරීක්ෂණයේ තීරණය අසාධාරණ සහ අයුක්ති සහගත බව ප්‍රකාශකරන ලෙසටත්,

ආ - ඉල්ලුම්කරු වෙත පනවන ලද දඬුවම් අසාධාරණ හා නීත්‍යානුකූල නොවන බවට තීරණය කොට එම දඬුවම් ඉවත් කරන ලෙසත්,

ඇ - 2011.07.03 දින සිට ඉල්ලුම්කරු වෙත M3 ගබඩා නිලධාරි විශේෂ ශ්‍රේණිය සඳහා ඉල්ලුම්කරු පත්කිරීමට නියෝග කරන ලෙසත්,

ඈ - වැඩ තහනමට ලක්වී සිටි කාල සීමාව සඳහා නොගෙවන ලද අඩ වැටුප් සහ අනෙකුත් දීමනා ගෙවන ලෙසට නියෝග කරන ලෙසටත්,

ඉ - වෙනත් ලැබිය යුතු සහනයන් ලබාදෙන ලෙසටත්.

ඊ - මෙම කාර්මික ආරවුලට ආයතනය සාධාරණ ප්‍රතිචාරයක් නොදක්වන්නේ නම් එය බේරුම්කරණයට යොමු කරන ලෙසටත් අයැද ඇත.

2015.12.08 වන දින ඉදිරිපත්කරන ලද පැමිණිල්ලට දින රහිතව සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගම විසින් ඇමුණුම් අංක 01 සිට 08 දක්වා ලේඛනවල ඡායා පිටපත් සමග උත්තර ප්‍රකාශයක් ගොනුකර ඇත.

එකී පිළිතුරු ප්‍රකාශය සඳහා 2017.10.25 වන දින ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් දීර්ඝ ප්‍රතිපිළිතුරු ප්‍රකාශයක් ගොනුකර ඇත. එකී ප්‍රති පිළිතුරු ප්‍රකාශය සමග "ඇමුණුම් අංක 01 සිට අමුණුම් අංක 32" දක්වා ලේඛන ඉදිරිපත්කර ඇත. ඊට පසුව ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් 2017.11.25 වන දාතමින් A/ 36/ 2017 සහ 2017.10.30 වන දිනය ට අදාළ ලිපියට පිළිතුරු වශයෙන් නැවතත් ප්‍රතිඋත්තර ප්‍රකාශයක් ගොනුකර ඇත.

කාර්මික අධිකරණය ඉදිරියේ බේරුම් කිරීම සඳහා ඉදිරිපත්ව ඇති ප්‍රශ්නූත ආරාවුල කුමක්ද යන්න මෙම නඩුවේ ප්‍රදානය ලබාදීමට පෙර පළමුවෙන්ම සළකා බැලියයුතු කරුණ වන්නේ ය.

වගඋත්තරකාර පාර්ශ්වයේ උත්තර ප්‍රකාශය අනුව ඔවුන් කාර්මික අධිකරණය වෙත දන්වා ඇත්තේ ඉල්ලුම්කරුගේ සේවා කාලය තුළ ඔහු සම්බන්ධයෙන් කිසිදු අසාධාරණ ක්‍රියා පිළිවෙලක් අනුගමනයකර නොමැති බවත්, ඉල්ලුම්කරු විසින් සිදුකර ඇති

විනය විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් ආයතනයේ ක්‍රියාත්මක වන නීති රෙගුලාසි වලට අනුව ක්‍රියා මාර්ග අනුගමනය කර ඇති බවත් ඒ අනුව ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ඉල්ලා ඇති සහනයන් ලබාදීමට හැකියාවක් නොමැති බවත් ය.

මෙම නඩු කටයුත්ත ආරම්භ කිරීමේ මුල් වගකීම වගඋත්තරකාර ආයතනය වෙත පැවරී ඇති අතර ඒ අනුව වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් මානව සම්පත් හා පාරිපාලන අංශ ප්‍රධානී ඩී. මුණසිංහ මහතාත්, වගඋත්තරකාර ආයතනයේ වර්තමාන පිරිස් කළමණාකාරිනි චමිලා වීරසේකර මහත්මියත් සාක්ෂි ලබාදී ඇති අතර, වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් "R 1 " සිට "R 13" දක්වා ලේඛන ලකුණු කරමින් ස්වකීය නඩුව අවසන් කර ඇත.

ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් මෙම නඩුවේදී ඉල්ලුම්කරු විසින් සාක්ෂි ලබාදී ඇති අතර, ඔහුගේ නඩුව ඔප්පු කිරීම සඳහා " A 1 සිට A 52" දක්වා ලේඛන ලකුණුකර ඇති අතර, ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ සේවය කොට දැනට විශ්‍රාම ලබා ඇති සුරේන්ද්‍ර රාජසිංහ නැමති සේවකයා සාක්ෂි ලබා දී ඇත.

එසේම " A 15" ,"A 15 (9)", " A 34", " A 41" සහ " A 42" ලෙස ලකුණු කරන ලද ලේඛන නිසි පරිදි ඔප්පුකර නොමැති හෙයින් එකී ලේඛන සාක්ෂි වශයෙන් භාර නොගන්නා ලෙසට වගඋත්තරකාර පාර්ශ්වය නඩුව අවසන් කරන අවස්ථාවේදී ආයාචනා කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් ඉල්ලුම්කාර පාර්ශ්වය කිසිවක් ප්‍රකාශකර හෝ එකී ලේඛන භාරගන්නා ලෙසට නැවත අයැදීමක් සිදුකර නොමැත. ඒ අනුව ඉල්ලුම්කරු වෙනුවෙන් එකී ලේඛන බැහැර කරමින් අනිකුත් ලේඛන සළකා බැලීමට කාර්මික අධිකරණය තීරණයකර ඇත.

දෙපාර්ශ්වයේ සාක්ෂි මෙහෙයවීමෙන් පසුව දෙපාර්ශ්වය විසින් ලිඛිත දේශන ගොනුකර ඇති අතර, ඉල්ලුම්කරු විසින් 2023.02.10 වන දින ද, වගඋත්තරකරු විසින් 2023.02.20 වන දින ද ලිඛිත දේශන ගොනුකර ඇත.

මෙම නඩුව සම්බන්ධයෙන් අවසාන තීරණය ප්‍රකාශයට පත්කිරීමට පෙර සළකා බැලිය යුතු ප්‍රධාන කාරණා 03 ක් ඇත. එනම්,

* ඉල්ලුම්කරු වගඋත්තරකාර ආයතනයේ පැවති නීති රීති සහ චක්‍රලේඛ වලට අනුව උසස්වීමක් ලැබීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත්තේද ?
* එසේ උසස්වීමක් ලැබීමට අවශ්‍ය සුදුසුකම් සපුරා තිබියදී එකී උසස්වීම ලබාදීම වගඋත්තරකාර ආයතනය විසින් සිතා මතාම මගහරිමින් සහ/හෝ පැහැර හරිමින් කටයුතුකර ඇත්තේ ද?
* වග උත්තරකාර ආයතනයේ ඉහත කී ක්‍රියා කලාපය සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් දක්වා ඇති ප්‍රතිචාර සාධාරණ සහ යුක්ති සහගත ඒවා වන්නේ ද? යනුවෙනි.

ඉහත කී කාරණා ඉදිරිපත්ව ඇති සාක්ෂි අනුව විමසා බැලීමක් පළමුව සිදුකළ යුතු ය.

මෙම ආරවුලට අදළ දෙපාර්ශවය ම ඉල්ලුම්කරු 1991.07.03 වන දින විධායක ශ්‍රේණියට අයත් ගබඩා නිළධාරිවරයකු වශයෙන් සීමා සහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ සේවයට බැඳුණු බව

පිළිගෙන ඇත. 1991. 07. 03 වන දින සේවයට බැඳුණු ඉල්ලුම්කරු ආයතනයේ පවතින නිති රීති සහ චක්‍රලේඛ, රෙගුලාසි අනුව වසර 15 ක සේවා කාලය සම්පූර්ණ කරනුයේ 2006.07.03 වැනි දිනට වේ. ඊට පෙර එනම් 2004.11.04 වැනි දින සමාගමේ පුහුණු කිරීමේ ඉංජිනේරුවරයෙකු වූ එස්.එච්.පී.එස්. චන්ද්‍රසේන මහතා ට පහරදීම සම්බන්ධයෙන් පවත්වන ලද විනය පරීක්ෂණයේ දී එකී පහරදීමේ විෂමාචාර ක්‍රියාවට සහ ඊට අනුශාංගික චෝදනා 04 කට ඉල්ලුම්කරු වරදකරු බවට තීරණය කොට දඬුවම් පමුණුවා ඇත. ඒ බව ''A43'' ලෙස ලකුණුකර ඇති ලේඛනයෙන් තහවුරු වේ.

වගඋත්තරකාර ආයතනය විසින් 2005.07.29 වැනි දින විධායක ශ්‍රේණිවලට අයත් නිලධාරීන් සඳහා වූ උසස්වීමේ ක්‍රියා පටිපාටියට අදාළව චක්‍රලේඛයක් එනම් ''A44 චක්‍රලේඛය'' නිකුත්කර ඇත. එකී චක්‍රලේඛය ද, 2005.01.11 සහ 2005.04.21 යන දිනවලදී නිකුත් කරන ලද චක්‍රලේඛය ද සංශෝධනය කරමින් 2012.10.02 දිනැතිව නව චක්‍රලේඛයක් නිකුත්කර ඇත. එකී චක්‍රලේඛය ඉල්ලුම්කරු විසින් ''A31'' වශයෙන් ලකුණුකොට ඇත. ''A31'' දරන ලේඛනය අනුව එකම වැටුප් ශ්‍රේණියක හෝ තනතුරක වසර 10ක් සම්පූර්ණ කරන සේවකයන්ගේ පෞද්ගලික ලිපිගොනුවල අසාදු වාර්තා නොමැති නම් මොවුන්ගේ කාර්යක්ෂමතා වාර්තා සහ ශාඛා කළමනාකරුවන්ගේ හෝ අදාළ අංශ භාර කළමනාකරුවන්ගේ ද නිර්දේශ සලකා බලා සම්මුඛ පරීක්ෂණයක් / ලිඛිත පරීක්ෂණයකින් පසුව දැනට සිටින වැටුප් පරිමාණයට වඩා ඉහළ වැටුප් පරිමාණයෙහි පිහිටුවන ලබන බවත්, වසර 10ක සේවා කාලය සම්පූර්ණ කළ දින සිට ගණනය කර ඒ ඒ සේවකයාගේ මාසික වැටුප් තලය නිර්ණය කරනු ලබන බවත් එකී චක්‍රලේඛය අනුව පැහැදිලි වේ.

ඉහත කී ''A31'' දරන චක්‍රලේඛය අනුව මුල්ම අවස්ථාවේ දී ඉල්ලුම්කරු වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබනුයේ 2001.07.03 වැනි දිනට වේ. තව ද නමුත් ඊට පෙර නිකුත් කර තිබූ චක්‍රලේඛය අනුව (A44 ලේඛනය අනුව) වසර 15ක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන්නේ 2006.07.03 වැනි දිනට වේ. මෙම කාල සීමාව වන විට දී ඉල්ලුම්කරු පහර දීමක් හේතුවෙන් පැවැත්වූ විනය පරීක්ෂණයක දී වරදකරු වී ඇත. ඉල්ලුම්කරුගේ මෙකී ක්‍රියාව ''A9'' ලෙස ලකුණු කර ඇති 2006.09.12 දින දරන ලේඛනයේ 02 වන අයිතමය යටතේ බරපතල විෂමාචාර ක්‍රියාවක් යටතට ගැනෙන ක්‍රියාවක් වන හෙයින් ද විනය පරීක්ෂණයකින් දඬුවම් ලබා ඇති හෙයින් ද සහ 2005.01.01 දිනට පෙරාතුව වර්ෂ 05ක කාලයක් ඇතුළත සිදුකරන ලද විෂමාචාර ක්‍රියාවක් වන හෙයින් ද එම කාල සීමාවේ දී ඉල්ලුම්කරුට උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොමැති බව වගඋත්තරකාර ආයතනය විසින් දන්වා සිටිය ද, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද පරීක්ෂණයක අවසානයේ 2007.03.03 වැනි දින නැවත M2 වැටුප් පරිමාණයේ ඉල්ලුම්කරු සේවයේ පිහිටුවා ඇත.

වගඋත්තරකාර ආයතනය විසින් නිකුත් කරන ලද ''A31'' දරන චක්‍රලේඛය ප්‍රකාරව වසර 10ක කාල සීමාවක් එකම තනතුරක සේවය කිරීම මත ඉල්ලුම්කරු නැවතත් 2011.07.03 දිනට ගබඩා නිලධාරී විශේෂ (M3) ශ්‍රේණිය සඳහා උසස්වීමක් ලැබීමට හිමිකම් ලබා ඇති බව තීරණය කළ හැක. ඒ අනුව ඉල්ලුම්කරු හට M3 ශ්‍රේණිය සඳහා උසස්වීම ලබාදීමේ දී වගඋත්තරකාර ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය අනුගමනය කරන ලද කාර්ය පටිපාටිය ඉතා අලස වූ එකක් බව ඉදිරිපත්ව ඇති සාක්ෂි හා ලේඛන අනුව පැහැදිලි වේ. 2011 වර්ෂයේ දී ලැබීමට නියමිතව තිබූ උසස්වීම සඳහා සම්මුඛ පරීක්ෂණය සඳහා ප්‍රථම වරට කැඳවා ඇත්තේ 2013.11.12 වැනි දින වේ. එදින ද සම්මුඛ පරීක්ෂණ නොපවත්වා ඇති අතර, නැවත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඇත්තේ 2014.01.03 වැනි දින වේ. කෙසේ වුවද සම්මුඛ පරීක්ෂණයට නැවත කැඳවා ඇත්තේ 2014.02.11 වැනි දින දීය. සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව එනම් සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ දිනට පසුදා එනම් වර්ෂ 2014.02.12 වැනි දින ඉල්ලුම්කරු වස්කඩුව මධ්‍යම ගබඩාවට ස්ථාන මාරුවක් ලබා දී ඇත. සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් අනතුරුව සුදුසුකම් සම්පූර්ණකර ඇත්නම් සුදුසුකම් සම්පූර්ණ කළ දිනයේ සිට අදාළ උසස්වීම සහ ඉහළ වැටුප් ශ්‍රේණියේ පිහිටුවාලීම කළයුතු

වුවත්, වගඋත්තරකාර ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය 2014.03.25 වැනි දින දක්වාම පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් කිසිදු පිළිතුරක් වගඋත්තරකරු වෙත ලබාදීමට කටයුතුකර නොමැති බව පෙනී යයි. එසේම වගඋත්තරකරු විසින් ලකුණුකර ඉදිරිපත්කර ඇති ''A2'', ''A3'', ''A4'', ''A5'', ''A6'', ''A7'' සහ ''A9'' දරන ලේඛන අනුව පැහැදිලි වන්නේ ඉල්ලුම්කරු හට හිමිවිය යුතු උසස්වීම ලබා ගැනීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ 2011 වසරේ සිට 2014.02.11 වැනි දින දක්වා එනම් සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ දිනය වන තෙක් ඔහුට හිමි උසස්වීම් ලබාගැනීම සඳහා ආයතනයේ සාමාන්‍යාධිකාරි ඇතුළු ඉහළ පාලන අධිකාරියට මෙන්ම මානව සම්පත් කළමනාකාරතුමා ඇතුළු නිලධාරින් දැනුවත් කරමින් ලිපි රාශියක් යොමුකොට ඇති බවය. එකී ලිපිවලට ආයතනය විසින් දක්වූ ප්‍රතිචාරයක් වශයෙන් සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති බව පැහැදිලි වේ.

සම්මුඛ පරීක්ෂණය පවත්වා ඒ පිළිබඳව අවසාන තීරණයක් දැනුම්දීම සඳහා 2014.02.11 දින සිට 2014.03.25 දක්වා මාස 01යි දින 14ක් ගතකර ඇත.

මාස 01යි දින 14ක් පිළිතුරක් අපේක්ෂාවෙන් සිටි ඉල්ලුම්කරු මානව සම්පත් කළමනාකාර ධර්මරත්න මුණසිංහ මහතා දුරකථන මාර්ගය ඔස්සේ අමතා ඇති බව තහවුරු වේ. එකී දුරකථන සංවාදයේ දී මානව සම්පත් කළමනාකාර මහතා අමතා විධානාත්මකව හා අවිනීත ආකාරයෙන් උසස්වීම සම්බන්ධයෙන් තොරතුරු විමසීමක් සිදුකළ බවත්, එකී තොරතුරු විමසීමට පිළිතුරු දීමෙන් පසුව අශිෂ්ඨ, තර්ජනාත්මක හා විධානාත්මක ස්වරූපයෙන් මානව සම්පත් කළමනාකාර මහතාගේ තනතුරට අපහාස වන ආකාරයට ක්‍රියාකළ බවත් දක්වමින් 2014.07.22 වැනි දින දරන චෝදනා පත්‍රය (A40X) ඉල්ලුම්කරු වෙත නිකුත්කර ඇත. එකී චෝදනා පත්‍රයට ඉල්ලුම්කරු විසින් නිවැරදිකරු බවට ප්‍රකාශ කරමින් 2014.07.28 වැනි දින දරන ලිපිය (A01) යවා ඇත. අදාළ දුරකථන සංවාදය සිදු වූ දිනම එනම් 2014.03.25 වැනි දින ඉංජිනේරු අංශ ප්‍රධානී විසින් ඉල්ලුම්කරුගේ සේවය අත්හිටුවමින් ''A39X'' දරන ලිපිය එවා ඇත. 2014.03.25 වැනි දින දරන ලිපිය ප්‍රකාරව, (A39X) විධිමත් පරීක්ෂණයක් පවත්වන බව දන්වා ඇතත්, එකී පරීක්ෂණය සාධාරණ කාල සීමාවක් තුළ පවත්වා නැත. පරීක්ෂණ පැවැත්වීම ප්‍රමාදවීම සම්බන්ධයෙන් 2014.07.01 වැනි දින ඉල්ලුම්කරු විසින් ලිපියක් (A20) ද ඉදිරිපත් කර ඇත. එකී ලිපිය යොමු කිරීමෙන් පසුව ද ආයතනයක් නිහඬ ප්‍රතිපත්තිය තවදුරටත් ක්‍රියාත්මක වී ඇති හෙයින් ඉල්ලුම්කරු විසින් 2014.07.21 වැනි දින නැවත සාමාන්‍යාධිකාරිතුමා අමතා ලියාපදිංචි තැපැල් මගින් ලිපියක් (A21) යවා ඇති බව තහවුරු වේ. එකී 2014.07.21 දරන ලිපියට පසුව 2014.07.22 වැනි දින දරන චෝදනා පත්‍රය (A40X) ඉල්ලුම්කරු වෙත ඉදිරිපත්කර ඇත.

ආයතනයේ මෙහෙයවීම මත විනය පරීක්ෂණයක් පවත්වා ඇති බව තහවුරු වේ. නමුත් එකී පරීක්ෂණය ද ඉතා මන්දගාමීව සිදු වී ඇති බව පෙනේ. 2015.08.24 වැනි දාතමින් යුතුව ඉල්ලුම්කරු විසින් පිරිස් කළමනාකාරතුමා අමතා ලිපියක් (A41) යොමු කරමින් විනය පරීක්ෂණයෙන් පසුව ගන්නා ලද තීරණය පිළිබඳ විමසීමක් කර ඇත. එකී ලිපියට පිළිතුරක් නොලැබූ ඉල්ලුම්කරු 2015.09.28 වැනි දින නැවතත් පිරිස් කළමනාකාර මහතා අමතමින් විනය පරීක්ෂණයේ තීරණය දැනගැනීම සඳහා A42 දරන ලිපිය යොමුකර ඇත. ඉහත කී ලිපි දෙකෙන් අනතුරුව 2015.10.13 වැනි දින පවත්වන ලද පරීක්ෂණයේ තීරණය (A43) වගඋත්තරකරු වෙත දන්වා යවා ඇත.

වර්ෂ 2015.10.13 වැනි දින දරන ලිපියට අනුව වගඋත්තරකාර ආයතනයක් විනය කාර්ය සංග්‍රහයේ II පරිශිෂ්ඨයේ A උපලේඛනයේ සඳහන් ප්‍රකාරව, සේවයෙන් පහකර දඬුවම් ලබාදීමට තරම් ප්‍රබල වරදක් සිදුකර ඇති බවත්, 2004 වර්ෂයේ දී පුහුණු කිරීමේ ඉංජිනේරු එස්. එච්. පී. එස්. චන්ද්‍රසේන මහතාට පහරදීම සම්බන්ධයෙන් වූ චෝදනාව සඳහා වරදකරු වී ඇති හෙයින් ද 2005.01.01 වැනි දිනට නියමිත වැටුප් වර්ධකය වසර 01 ක කාලයක් සඳහා විලම්භනය කොට ඉදිරියේ දී මෙවැනි

ආකාරයේ විෂමාචාර ක්‍රියාවල නොයෙදන ලෙසට අවවාද කර ඇති බව ද සිහිපත් කරමින් සානුකම්පිතව සළකාබලා ගබඩා නිලධාරි තනතුරේ සේවයෙන් පහකිරීම වෙනුවට පහත දැක්වෙන දඬුවම්වලට යටත්ව සේවයේ පිහිටුවා ඇත.

- ''ගබඩා නිලධාරි M2 වැටුප් ශ්‍රේණියේ තනතුරින් ගබඩා සහකාර A5 වැටුප් ශ්‍රේණියට පහත හෙළීම.
- මින් ඉදිරියට මෙවැනි විෂමාචාර ක්‍රියාවලින් වැලකී සිටින ලෙසට අවසාන වතාවට තරයේ අවවාද කිරීම වේ.''

2015.10.13 වැනි දින දරන ලිපියට පිළිතුරු වශයෙන් වගඋත්තරකරු විසින් 2015.10.26 දින දරන ලිපිය (A25) ඉංජිනේරු අංශ ප්‍රධානි වෙත යොමුකර ඇත.

2015.10.13 වැනි දින දරන ලිපියට පිළිතුරු වශයෙන් වගඋත්තරකාර ආයතනය විසින් 2015.10.28 දින දරන ලිපිය (A26) ඉදිරිපත්කර ඇත. එකී ලිපියට පිළිතුරු වශයෙන් ඉල්ලුම්කරු විසින් 2015.11.01 දින දරන ලිපිය (A27) පිරිස් කළමනාකාරතුමා වෙත ඉදිරිපත්කර ඇත. වගඋත්තරකාර ආයතනය සහ ඉල්ලුම්කරු අතර හුවමාරු වී ඇති ලිපි ලේඛන පැහැදිලිව අධ්‍යයන කිරීමේදී පෙනී යන්නේ ඉල්ලුම්කරු නැවත සේවයේ පිහිටුවා ඇත්තේ සේවය අතහැර යාමට හේතුවෙන තරම් ප්‍රමාණවත් වටපිටාවක් නිර්මාණය වන ආකාරයට වේ.

ඉහත සඳහන් කරන සමස්ථ ලේඛන සහ කරුණු සළකා බලන කළ පැහැදිලි වන්නේ ඉල්ලුම්කරු වගඋත්තරකාර ආයතනයේ පැවති නීති රීති සහ චක්‍රලේඛවලට අනුව උසස්වීමක් ලැබීමට අවශ්‍ය වන සුදුසුකම් 2014.03.25 වන දින වන විට සපුරා තිබිය දී ආයතනයේ ඉහළ කළමණාකාරීත්වය එකී උසස්වීම ලබාදීම සිතා මතාම මගහරිමින් සහ / හෝ පැහැර හරිමින් කටයුතුකර ඇති බවය.

එවැනි පසුබිමක් තුළ වගඋත්තරකාර ආයතනය තුළ සේවය කළ ඉල්ලුම්කරු හා සමානව නොවූවත් විෂාමාචාර ක්‍රියා සම්බන්ධයෙන් දඬුවම් ලබා තිබූ වෙනත් සේවකයන් ට උසස්වීම ලබාදී ඇති බව ද ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව තහවුරු වී ඇත. හොරකම් කිරීම, වංචා කිරීම, අල්ලස් ලබා ගැනීම, විදුලි මනු වෙනස් කිරීම, අනවසරයෙන් විදුලි රැහැන් මාරු කිරීම වැනි බරපතල සේවක විෂමාචාර ක්‍රියා වන්නා වූද සහ අපරාධමය වැරදි ගණයට ගැනෙන විෂමාචාර ක්‍රියා සම්බන්ධයෙන් ද ආයතනය අනුගමනයකර ඇත්තේ ලිහිල් ප්‍රතිපත්තියක් බව තහවුරු වී ඇත. තව ද පුහුණු කිරීමේ විදුලි ඉංජිනේරු මහතාට පහරදීම සම්බන්ධයෙන් පවරා තිබූ අපරාධ නඩුවට සාක්ෂිදීම සඳහා ඉංජිනේරුවරයා නොපැමිණීම මත ඉල්ලුම්කරු නිදහස් කොට ඇත. එසේම එකී කාරණය සම්බන්ධයෙන් විනය පරීක්ෂණයේදී ඉල්ලුම්කරු නැවතත් M2 වැටුප් ශ්‍රේණියේම තබා සේවයේ පිහිටුවා ඇත.

වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් විශ්‍රාම ලැබූ මානව සම්පත් කළමණාකාර මහතාත්, පිරිස් කළමණාකාර තුමියත් සාක්ෂි ලබාදී ඇත. වගඋත්තරකරුගේ නඩුව සනාථ කිරීම සඳහා ''R 1'' සිට ''R 13'' දක්වා ලේඛන ගොනුකර ඇත. වගඋත්තරකාර ආයතනයේ ප්‍රධානම ඔප්පු කිරීමේ භාරය වන්නේ මානව සම්පත් කළමණාකරු වූ ධර්මරත්න මුණසිංහ මහතාට අවිනීත, අශිෂ්ඨ වචන භාවිතා කරමින් දුරකථන මාර්ග යෙන් ඉල්ලුම්කරු තර්ජනාත්මක බැන වැදීමක් සිදුකර ඇති බවත්, එකී හේතුව මත ඉල්ලුම්කරු විනය නියෝගයක් මත සේවයෙන් පහත හෙලූ බවත් සනාථ කිරීමටය. මෙකී කරුණ සනාථ කිරීමේදී මානව සම්පත් කළමණාකරු විසින් ලබාදී ඇති සාක්ෂිය තීරණාත්මක සාක්ෂියක් වේ. නමුත් මානව සම්පත් කළමණාකරුවෙකු වශයෙන් වසර ගණනාවක අත්දැකීම් ඇති සාක්ෂිකරුවකු වශයෙන් ඔහුගේ සාක්ෂිය ඉතා දුර්වල මට්ටමක පවතින බව විනිශ්චය අධිකාරියේ මතය වේ. දුරකථන සංවාදයක් අතරතුර ඉල්ලුම්කරු විසින් ප්‍රකාශ කළා යැයි කියනු ලබන ප්‍රකාශ සිදුකළ බවට තහවුරු කිරීම සඳහා ආයතනයේ දුරකථන ඇමතුම් පිළිබඳ විස්තර දැක්වෙන තොරතුරු නාමාවලියක් හෝ ඉල්ලුම්කාර ආයතනයේ ස්ථාවරය සනාථ කිරීම සඳහා ගරු විනිශ්චය අධිකාරිය වෙත ඉදරිපත්කර නැත. තවද මානව සම්පත් කළමණාකරු විසින් සාක්ෂියේදී තහවුරු වී ඇත්තේ ඉල්ලුම්කරු සේවය කළ ස්ථානයේ තවත් සේවකයන් සිටිය යුතු බවය.

වගඋත්තරකරු ස්ථාවරය සනාථ කිරීම සඳහා ස්වාධීන සාක්ෂිකරුවකු වශයෙන් විශ්‍රාමික සේවකයකු වන සුරේන්ද්‍ර රාජසිංහ මහතා සාක්ෂි ලබාදී ඇත. ඔහුගේ සාක්ෂියේ දී ඉතා පැහැදිලිව ඉල්ලුම්කරුගේ පාර්ශ්වය දුරකථන සංවාදයේ යෙදුණු අන්දම සහ ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් භාවිතා කළ වචන පිළිබඳව ඇසදුටු සාක්ෂියක් මගින් තහවුරු කර ඇත. එකී සාක්ෂියේදී ඉල්ලුම්කරු විසින් වගඋත්තරකාර ආයතනයේ මානව සම්පත් කළමණාකරු විසින් ප්‍රකාශකර සිටින අන්දමේ අශීලාචාර වචන භාවිතා කරමින් දුරකථන සංවාදයක් සිදු නොවූ බවට සාක්ෂි ලබාදී ඇත. එමෙන්ම එකී දුරකථන සංවාදය සිදුවීමෙන් අනතුරුව ඉල්ලුම්කරු සේවය අවසන්කර ආයතනයෙන් පිටත්ව යාමෙන් අනතුරුව ඉල්ලුම්කරුගේ සේවය අත්හිටුවමින් ෆැක්ස් පණිවුඩයක් ලැබුණු බවට සාක්ෂි ලබාදී ඇත. වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් පිරිස් කළමණාකාරතුමිය ද සාක්ෂි ලබා දී ඇත්තේ නිල මට්ටමේ සාක්ෂිකාරියක වශයෙන් වේ. ඇයගේ සාක්ෂියේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ ආයතනයේ පවතින නීති රීති රෙගුලාසි සම්බන්ධයෙන් විනිශ්චය අධිකාරිය දැනුවත් කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම වේ.

විනිශ්ච අධිකාරිය වෙත ඉදිරිපත්ව ඇති දෙපාර්ශවයේ සාක්ෂි සළකා බැලීමේ දී පැහැදිලිවම පෙනී යන්නේ ඉල්ලුම්කරු වශයෙන් ආයතනය ඉතා දීර්ඝ කාලයක් තිස්සේ අනුගමනය කර ඇති ප්‍රතිපත්තිය යුක්ති සහගත සාධාරණ ප්‍රතිපත්තියක් නොවන බව ය. ඉතා දීර්ඝ කාලයක් තිස්සේ සේවය කළ නිලධාරියකු අතින් සිදුවූ වැරදි සම්බන්ධයෙන් සමාව දී සාධාරණව කටයුතුකර ඇති බව පෙන්වමින් ඉල්ලුම්කාර සේවකයා පිඩාවට පත්වන ආකාරයට කටයුතුකර ඇත. ඉල්ලුම්කරු වෙත ඉදිරිපත්කර ඇති සියළු චෝදනාවලදී ඉල්ලුම්කරු ඔහුගේ නිවැරදිභාවය වෙනුවෙන් අඛණ්ඩව කටයුතු කොට කම්කරු විනිශ්චයාධිකාරවල පිහිට පතා යුක්තිය ඉෂ්ටකරවාගෙන ඇත. මෙවැනි අන්දමේ සේවකයන් සම්බන්ධයෙන් ආයතන තුළ ඉහළ කළමණාකාරිත්වය දක්වන අප්‍රසාදයක් හේතුවෙන් මොහු හට හිමිවිය යුතු උසස්වීම ලබාදීම හිතාමතාම පැහැර හැර ඇති බවට තීරණය කරමි. ඉල්ලුම්කරු ප්‍රකෝප කිරීමක් සඳහා වන පරිසරයක් වගඋත්තර ආයතනයේ යම් යම් ක්‍රියා හේතුවෙන් සිදුවී ඇති බව පෙනී ගියත්, ඉල්ලුම්කරු ආවේගශීලීව හැසුරුණු බව සනාථ කිරීමට ප්‍රමාණවත් තරම් සාක්ෂි මෙම විනිශ්චයාධිකාරියට ඉදිරිපත් කිරීමට වගඋත්තරකාර ආයතනය අපොහොසත් ඇති බවට තීරණය කරමි.

ඒ අනුව මෙම නඩුවේ ඉල්ලුම්කරු සීමා සහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ A5 ශ්‍රේණියේ ගබඩා සහකාර තනතුරට සේවයෙන් පහත හෙළීම සහ විනය නියෝගයෙන් ඔහු වෙත ලබාදුන් අනෙකුත් දඬුවම් යුක්ති සහගත නොවන බව ශක්‍යතා වැඩිබර සම්මතය අනුව තීරණය කරමි. ඒ අනුව ඉල්ලුම්කරු හිමිවිය යුතුව තිබූ ගබඩා නිළධාරි M3 විශේෂ ශ්‍රේණිය සඳහා උසස්වීමක් ලැබීමට සුදුසුකම් සපුරා ඇති හෙයින්. එකී M3 විශේෂ ශ්‍රේණියේ පිහිටුවූ 2014.04.01 දින සිට ගබඩා නිලධාරි M3 විශේෂ ශ්‍රේණිය ට හිමි සියළු වරප්‍රසාද " A31 " චක්‍රලේඛයට අනුව ලැබිය යුතු බවටත් තීරණය කරමි.

ඒ අනුව, 2014.04.01 දින සිට 2022 වර්ෂය සඳහා ඉල්ලුම්කරු වෙත ගෙවන ලද වැටුප් සහ අනෙකුත් දීමනා අඩු කොට එකී ශ්‍රේණියට නියමිත වැටුප සහ අනෙකුත් දීමනා සඳහා ලැබ් යුතු මුදලේ හිඟ මුදල වශයෙන් පවතින රුපියල් හතලිස්දෙලක්ෂ හැත්තෑහතරදහස් තුන්සිය තිහ (රු. 42,74,330.00)ක මුදල *ගැසට් ගත* කිරීමෙන් මසක් ඇතුළත නැගෙනහිර - කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයය වෙත තැම්පත් කළ යුතු බවටත් තීරණය කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

බේරුම්කරු.
නීතිඥ ඒ. ඒ. කේ. දිපශික ධර්මදාස,

කාර්මික අධිකරණය - 09 වන මහළ.
කම්කරු මහලේකම් කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ 05.

ECG06-0025

මගේ අංකය: IR/10/21/2012.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.05.16 දිනැති හා අංක 1862/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2014.04.11 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කෙන්ගල්ල, බලගොල්ල, අංක 53 හි පදිංචි සී. බී. තෙන්නකෝන් මයා සහ කොළඹ 01, චෛත්‍ය පාර, අංක 19 හි පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව,බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.04.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මැයි මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී
නඩු අංකය - A /3558
IR/10/21/2021

සී. බී. තෙන්නකෝන්,
අංක 53,
බලගොල්ල,
කෙන්ගල්ල.

*එදිරිව*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 19,
චෛත්‍ය පාර,
කොළඹ 01.

**ප්‍රදානය**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති

බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සුනෙත් ලොකුබෝගහවත්ත වන මා 2014.04.11 වැනි දින පත්කර එය මා වෙත යොමු කර ඇත.

කම්කරු කොමසාරිස් ජනරාල් විසින් මා වෙත යොමු කරන ලද ආරාවුල වනාහි,

''ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොල අභ්‍යාස ආයතනයේ නියෝජ්‍ය ප්‍රධාන අභ්‍යාස කළමණාකරු ලෙස සේවය කළ සී. බී. තෙන්නකෝන් මහතා විශ්‍රාම යන අවස්ථාවේදී ගෙවන ලද වෛද්‍යාධාර දීමනාව අඩුකර ගෙවීම හේතුවෙන් යම් අසාධාරණයක් සිදුවූයේ යන්න හා එලෙස අසාධාරණයක් සිදුවූයේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ''.

කාර්මික ආරාවුල් පනත යටතේ සම්පාදක 21(1) නියෝගය ප්‍රකාරව දෙපාර්ශ්වයේ සවිස්තරාත්මක ප්‍රකාශ දැක්වීමෙන් අනතුරුව පිළිතුරු හුවමාරු කරවා ගැනීමට අවස්ථාව සළසා දී සමතයක් සඳහා ඉඩ ලබා දීමෙන් පසුව සමතයක් නොමැති බවට වාර්තා කිරීමෙන් අනතුරුව විභාගයට ගන්නා ලදී.
ඒ අනුව ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කරු සාක්ෂිය ලබා දීමට නියමිතව තිබිය දී වර්ෂ 2014.10.20 වැනි දිනැතිව ඉල්ලුම්කරු තමන් අසනීප තත්ත්වයෙන් ප්‍රතිකාර ලබාගන්නා බවත් මහනුවර සිට පොදු ප්‍රවාහන සේවය ඔස්සේ කොළඹ පැමිණීම දුෂ්කර බවත් දන්වමින් මහනුවර දිස්ත්‍රික්කයේ බේරුම්කාර මණ්ඩලයක් වෙත මෙම බේරුම්කරණය යොමු කරන ලෙසත් ඉල්ලා ලිපියක් එවා ඇත.

ඒ අනුව ඉල්ලුම්කරුගේ අසනීප තත්ත්වය සළකා බලා වර්ෂ 2014.10.23 වැනි දින මෙම බේරුම්කරණය ''නැවත කැඳවනු ලබන්නේ නම් සෑහීමට පත් විය හැකි වෛද්‍ය සහතික මෝසමක් සමග ඉදිරිපත් කළ යුතු බවට වැඩිදුරටත් නියම කරමි. ඒ අනුව මෙම බේරුම්කරණය බහා තබමි.'' යනුවෙන් සඳහන් කර බහා තබා ඇත. එසේම එදින කාර්ය සටහනේ පිටපතක් ඉල්ලුම්කරුට යවන ලෙසට කාර්මික අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට නියෝග කොට ඇත.

මේ අතර තුර කාර්මික අධිකරණයේ හා බේරුම්කරණයේ බහා තබන ලද නඩු නැවත කැඳවීමේ ප්‍රතිපත්තිමය තීරණය මත වර්ෂ 08කට පසුව වර්ෂ 2022ක්වූ දෙසැම්බර් මස 14 වැනි දින මෙම බේරුම්කරණය කැඳවන බවට ඉල්ලුම්කාර පාර්ශ්වය වෙත දැන්වීම් යවා ඇති අතර ඒ අනුව මෙම බේරුම්කරණය සක්‍රීය කොට වර්ෂ 2023 ක් වූ ජනවාරි මස 18 වැනි දින කැඳවන ලදී. එදිනට ඉල්ලුම්කාර පාර්ශ්වය මෙන්ම වගඋත්තර පාර්ශ්වය ද පෙනී සිටි අතර වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඉහත වර්ෂ 2014.10.23 දිනැති නියෝගය ප්‍රකාරව ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ගරු බේරුම්කරණය සෑහීමට පත්වන ආකාරයෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් කර මෙම නඩුව සක්‍රීය කර නොමැති බැවින් මෙම බේරුම්කරණය පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් කරන ලදී.

ඉල්ලුම්කාර පාර්ශ්වය තමන්ට ඉදිරිපත් කිරීමට වෛද්‍ය සහතික මේ අවස්ථාවේ දී නොමැති බවත් තමන් ආයුර්වේද වෛද්‍යවරයෙකුගෙන් ප්‍රකාරව ලබාගත් බවත් එකී වෛද්‍යවරයා දැනටමත් මියගොස් ඇති බවත් එබැවින් වෛද්‍ය සහතික ලබාගත නොහැකි බවත් ප්‍රකාශ කර සිටින ලදී.

ඒ අනුව වර්ෂ 2014.10.23 වැනි දිනැතිව ලබා දී ඇති නියෝගය ප්‍රකාරව කටයුතු කර නොමැති බවත් එසේ කටයුතු කිරීමට නුපුළුවන් බවත් තහවුරු වන බැවින් හා එකී නියෝගය ලබාදුන් කාලසීමාවට අදාළව කිසිදු කරුණක් මේ වන විට වෙනස් වී නොමැති බැවින් ද මා විසින් ලබා දුන් නියෝගයක් පසු අවස්ථාවක මා හට ද වෙනස් කළ නොහැක. ඒ අනුව ඉල්ලුම්කරු විසින් පසු අවස්ථාවක වුව ද වෛද්‍ය සහතික

ඉදිරිපත් කිරීමට නොහැකි බව ද දක්වා සිටින හෙයින් වෙනත් දිනයක් ලබා දුන්නේ වුව ද කිසිදු ප්‍රතිඵලයක් අත්නොවන බව පෙනී යයි. ඒ අනුව වර්ෂ 2014.10.23 වැනි දිනැති නියෝගය ප්‍රකාරව කටයුතු කර නොමැති බැවින් මෙම බේරුම්කරණය තව දුරටත් පවත්වාගෙන යෑමට නොහැකි බවට තීරණය කරමි.

ඒ කෙසේ වුව ද ඉල්ලුම්කරු වෙනත් විකල්පයක් යටතේ ඉල්ලුම්කරුට අඩු කර ගෙවනු ලැබුවේ යැයි යයි කියන හිඟ වෛද්‍යාදර දීමනාව ලබා ගැනීම සම්බන්ධයෙන් මෙම ප්‍රදානය බාදාවක් නොවන බවට සටහන් කර තබමි.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට සහතික කරමි.

එස්. ලෙකුබෝගහවත්ත,
බේරුම්කරු.

ECG06 - 0026